

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි

ISSN - 1391- 6785

තෙවන කාණ්ඩය, 1 සහ2 කලාප 2003


## දේශජනිත දැනුමෙන්. .

# වල් පැල වල ඖෂධීය වැදගත්කම්

පරිසරයේ ඇති ගහකොළපිලිබඳ ගැමියන්ට ඇත්තේ සුවිශේෂ දැනුමක්. සැම ගහකින් ම ලබා ගත හැකි ප්‍රයෝජනයන් ගැන ඔවුන්ට හොඳ අවබෝධයක් තියෙනව. එහෙත් තේ ඉඩම් වල වැවෙන වල් පැල හෝ වෙනත් පඳුරු දෙස තේ ගොවීන් විදිහට අප බලන්නෙ තරමක් අප්‍රසන්න හැඟීමකින්. මන්ද, අපේ තේ අස්වැන්න අඩු කිරීමට වල් පැල සැලකිය යුතු තරමින් දායක වන බව අප දන්න නිසයි.


තේ ඉඩම්වල වල්පැල ඇතිවීම සහමුලින්ම වලක්වා ගැනීමට අපට හැකියාවක් නැහැ.


විවිධ අවශ්‍යතාවයන් සඳහා තේ ඉඩම් වල හෝ තේ ඉඩම් ආශ්‍රිතව වෙනත් පඳුරු හෝ ගස් වර්ග වැවීමට ද අප නිර්දේශ කරනු ලබනවා. මේ ගස් වර්ග වලින් බලාපොරොත්තු වන මූලික අරමුණට අමතරව ඒවායින් ලබා ගත හැකි වෙනත් ආර්ථික වාසිද හඳුනාගැනීම ඔබට වැදගත් වනු ඇත.
අප වල් පැල ලෙස හඳුන්වන, තේ ඉඩම් වල වැවෙන පැලෑටි වල ඖෂධීය වටිනාකම ගැන ඔබට වැටහීමක් ලැබුනොත් වෙනත් ආකාරයකට වල්පැල දෙස බලන්න ඔබත් හුරු වේවි. තේ ඉඩම් වල වල්පැල පාලනය (manage) මිස වල් පැල සමූලඝාතනය (eradication) නොකලයුතු බව ඔබට එදාට අවබෝධ වේවි.
තේ ඉඩම් වල වැවෙන සමහර වල් පැල වල සහ වෙනත් පැල වර්ග වල ඖෂධීය වැදගත්කම්:-




**සැවැන්දරා:** මෙය තෘණ කුලයට අයත් ශාකයක් වන අතර තේ ඉඩම් වල පාංශු සංරක්ෂණය සඳහා බහුල ව යොදා ගනී. වැටිවේරියා ශිෂනියොයිඩස් (*Vetiveria zizanioides*) යන උද්භිද විද්‍යා නාමයෙන් හඳුන්වන මෙය වැටිවර් තෘණ ලෙස බොහෝ දෙනෙක් හඳුනයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රම වලදී උශිර ලෙස මෙය හඳුන්වයි. මෙම පැලෑටියේ මුල්වල ඖෂධීය ගුණ ඇත. කහපාටට හුරු දුඹුරු පැහැයක් ගන්නා මුල් මනා සුවඳකින් යුක්තය. මෙම මුල්වල ආවශ්‍යක තෛල (essential oil) වර්ග සහ දුම්මල වර්ග ඇත. සුවඳ විලවුන් සෑදීමට ද භාවිතා කරන මේවා මානෙල් අල සමඟ සාදන කෂාය ශීත ශක්තිජනක පානයක් ලෙස ආයුර්වේදයේ නිර්දේශ කරයි.


ධර්මප්‍රිය සමන්සිරි


**බැවිල:** මෙය උද්භිද විද්‍යාත්මකව Sida veronicaetolia සිඩා වෙරොනිකෙෆෝලියා ලෙස හඳුන්වන අතර ආයුර්වේදයේදී භූමිබලා ලෙස හඳුන්වයි.
මෙය ආයුර්වේදයේදී ශක්තිජනක ඖෂධයක් ලෙස භාවිතා කරයි. මෙහි පොතු සහමුල් අර්දිත රෝගය (facial paralysis) සඳහා ප්‍රතිකාරයක් ලෙස යොදා ගන්නා අතර චූර්ණකරන ල[illegible] මුල් සහපොතු ශ්වේද ප්‍රදර රෝගයට ප්‍රතිකාර ලෙස භාවිතා කරයි.

**ගස් කරල්හැබ:** ඇකිරන්තස් ඇස්පෙරා (Achyranthes aspera) යන උද්භිද නාමයෙන් හඳුන්වන ගස් කරල්හැබ, මැදරට සහපහතරට තේ ඉඩම් වල හමුවන වල් පැලෑටියකි. මෙය මීටර් 0.3 - 0.9 පමන උසට කෙලින් වැඩෙන ශාකයකි. කඳ තදය, අතු අඩුවෙන් තුනී ලෙස විහිදී ඇත. පත්‍ර ස්වල්පයක් ඇති අතර ඒවා ඝනකමය. පත්‍ර සෙ.මි. 3 - 12 දක්වා දිගය. මල් කැණක් ලෙස පිහිටන අතර එම මල් කැණ සෙ.මී. 50 පමණ දිග් විය හැක.
උන, උදරාබාධ හා අග්නිමාන්ද්‍ය රෝග ප්‍රතිකාර සඳහා ආයුර්වේදයේදී යොදා ගනී. මල්කැණ සර්ප දශ්ඨයට ප්‍රතිකාර ලෙස යොදා ගන්නා අතර පැලෑටියේ සැම කොටසක් ම සර්ප සහගෝණුසු දශ්ඨයට ප්‍රතිකාර කිරීමට යොදා ගනී.